සබරගමුව පළාත් සභාව - சபபிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சர்
Ministry Of Education, Information Technology & Cultural Affairs
Email||:edusabara@gmail.com Facebook||:SabEducationMinistry

මගේ අංකය / vdJ ,y / My Number: ME/E/2(සබර.ව)
ඔබේ අංකය / ckJ ,y / Your Number:
දිනය / jpfjp / Date: 2016.08. 10

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක**

**සබර/2016/03**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

## පළාත් අධ්‍යාපන උපදේශක කාරක සභා තීරණ ක්‍රියාත්මක කිරීම
## ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සඳහා සහභාගී වීම

2016/08/09 දින පැවැත්වූ සබරගමුව පළාත් අධ්‍යාපන උපදේශක කාරක සභාවේදී ගන්නා ලද තීරණ අනුව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02 ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වනු ලබන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වනු ලබන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන ප්‍රධානතම සංවර්ධන හා පරිපාලන කමිටු රැස්වීම් වේ.එම කමිටුවල සභාපති හා සම සභාපතිවරු පත් කරනු ලබන්නේද අතිගරු ජනාධිපතිතුමා විසින් බැවින් එම කමිටුවල වැදගත්කම පැහැදිලි වේ.

03 එබැවින් තම කලාපය තුළ පවත්වනු ලබන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමට අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු සහභාගී වීම අනිවාර්ය වේ. සමහර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට තම කලාපය තුළ සහභාගී විය යුතු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු

රැස්වීම් කිහිපයක් තිබෙන බැවින් එකම දින එක් රැස්වීමකට වඩා වැඩි රැස්වීම් පැවැත්වෙන අවස්ථාවක එම රැස්වීම් සඳහා අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක සහභාගි කරවීම අනිවාර්ය වේ.

04 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු සහභාගි වීම අනිවාර්ය වේ.

05 මෙම උපදෙස් තරයේ පිළිපදින ලෙස අවධාරණය කරමි.

Ministry of Provincial Education * Sabaragamuwa *

මහින්ද .එස්. වීරසූරිය,
ලේකම් ,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

පිටපත්: 01 දිස්ත්‍රික් ලේකම්/දිසාපති, රත්නපුර/කෑගල්ල - දැ.පි
02 ප්‍රාදේශීය ලේකම්වරු - දැ.පි
03 සහකාර විගණකාධිපති - දැ.පි